## පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2016

-----------------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර, විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2018 ජනවාරි 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ප්‍රමිතයේ ඡේද අංක 48 ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් වගකීම් හිලව් නොකළ යුතු වුවද, එකතුව රු.251,966,053 ක් වූ මුදල් බැර ශේෂ, එකතුව රු.482,766,698 ක් වූ හර ශේෂ 52 ක් සමඟ හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ ඡේද අංක 99 අනුව, අස්ථිත්වයක ඌනතාවය හා අතිරික්තය හඳුනා ගැනීමේදී සියළු ආදායම් හා වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් වෙනුවෙන් ආරම්භ කර තිබුණු අරමුදල් 596 ක් සඳහා ලැබී තිබූ රු.1,072,485,027 ක ආදායම් සහ රු.990,977,313 ක වියදම් එම අරමුදල් ගිණුම්වල ලැබීම් ගෙවීම් ලෙස ගැලපුම් කර එම ගිණුම්වල ශේෂයන් පමණක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණු විදේශ ශිෂ්‍යයින්ගෙන් ලැබී තිබූ රු.31,648,391 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී නැවත ක්‍රමක්ෂය ලෙස සංචලනය නොවන මුදල් ප්‍රවාහයන් යටතේ එකතු කර දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පරිත්‍යාග අරමුදල්වල වැඩිවීම රු.8,936,554 ක් ලෙස දක්වා තිබුණද, ඊට අදාළ උපලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි වැඩිවීම රු.9,891,671 ක් වූයෙන් රු.955,117 ක මුදල් ගලා ඒම් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ බාහිර පාර්ශව පර්යේෂණ අරමුදලේ මුදල් ගලා ඒම රු.52,602,726 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.10,268,052 ක මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.

(iv) විවිධ ණයගැති හා ලැබිය යුතු ශේෂවල වැඩිවීම රු.45,178,441 ක් වුවද, එය කාරක ප්‍රාග්ධන සංචලනය යටතේ රු.33,287,127 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.11,891,314 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂය තුළ ආදායම් උපයෝගී කරගෙන මිලදී ගෙන තිබූ රු.42,732,486 ක ස්ථාවර වත්කම් මුදල් නොවන ප්‍රවාහයක් ලෙස සලකා සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට එකතු කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

---------------------------------------------------

ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති සිදුවීම් අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළ නිලධාරියෙකුට 1982 නොවැම්බර් 01 දින සිට 2007 මාර්තු 07 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ විශ්‍රාම ප්‍රතිලාභ ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.5,466,982 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------------

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,108,945,094 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

---------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 100 සහ 105 ඡේද ප්‍රකාරව අස්ථිත්වයක් විසින් වාර්තාකරණ දිනට ඇති සෑම අසම්භාව්‍ය වගකීම් පන්තියක් සඳහාම අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය සහ අසම්භාව්‍ය වත්කම්වල ස්වභාවයෙහි සංක්ෂිප්ත විස්තරයක් හෙළිදරව් කළයුතු අතර, ප්‍රායෝගික අවස්ථාවලදී එහි මූල්‍ය බලපෑමේ ඇස්තමේන්තුවක් ද හෙළිදරව් කළ යුතු ය. ප්‍රමිතියෙහි 108 ඡේදය ප්‍රකාරව අවශ්‍ය වන කවර හෝ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රායෝගික නොවීම නිසා එසේ කර නොමැති අවස්ථාවලදී එම කරුණ හෙළිදරව් කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් වාර්තාකරණ දිනට පැවති නඩු 69 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම වෙනුවෙන් එම ශිෂ්‍යයින්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ අය කරන ලද රු.712,698 ක් විදේශ ශිෂ්‍ය ආදායම් ගිණුමට බැර කළ යුතු වුවත්, එම මුදල චක්‍රීය අරමුදල් ගිණුමට (Revolving Fund Account) බැර කර තිබුණි.

(ආ) වැය ශීර්ෂ 03 ක් යටතේ පෙර වර්ෂවලට අදාළව අවස්ථා 76 කදී ගෙවා තිබූ රු.715,087 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් 15 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.64,612,289 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ස්ථිර තැන්පතු සහතික 02 කට අදාළව වාර්ෂික පොලී ආදායම රු.136,548 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පුනරුත්ථාපනය සහ සංවර්ධනය සඳහා දරන ලද රු.302,621,361 ක වියදමින් රු.126,300,746 ක් පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණද, රු.23,625,883 ක් වූ ව්‍යාපෘති 03 ක නියැදියක් පරීක්ෂාවේදී එහි රු.17,545,990 ක ප්‍රාග්ධන වියදම් අන්තර්ගතව පැවතුණි.

(ඊ) විදේශ මුදල් හුවමාරු අගයේ උච්ඡාවචනය වීම මත හඳුනාගන්නා ලද විනිමය වාසිය හෝ අවාසිය කාර්යසාධන ප්‍රකාශනයට ගැලපීම් කරන බවට විශ්වවිද්‍යාල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනාගත් රු.365,842 ක් වූ විනිමය වාසිය ඒ අනුව කාර්යසාධන ප්‍රකාශනයට ගැලපීම් කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලයට අනුබද්ධ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය විසින් 2016 වර්ෂය තුළ මිල දී ගෙන තිබූ රු.2,092,858 ක් වටිනා ස්ථාවර වත්කම් සහ සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කරන ලද රු.314,951,861 ක් වටිනා පශු වෛද්‍ය හා වෛද්‍ය පීඨයට අයත් ගොඩනැගිලි 03 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබුණි.

(ඌ) දීමනා පත්‍රයක් මගින් විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇති දොඩම්ගොල්ල පර්යේෂණ ගොවිපොල පවත්වාගෙන යනු ලබන අක්කර 196 ක ඉඩමේ වටිනාකම තක්සේරු කර වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ඉංජිනේරු පීඨයේ නිෂ්පාදන ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ 2016 ජූලි 05 දින ගිනිගැනීමක් හේතුවෙන් සිදු වී ඇති රු.5,361,835 ක පාඩුව සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ඒ) රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යොදාගෙන මිලදීගත් වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලයට අනුරූපීව ක්‍රමක්ෂය ගණනය කළ යුතු වුවද ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.235,955,000 ක් වටිනා වාහන 168 ක් සම්බන්ධයෙන් එම වත්කම් මිලදී ගන්නා වර්ෂය හා ඉතිරි ජීව කාලය නොසළකා ප්‍රත්‍යාගණන වටිනාකමින් සියයට 20 ක් ලෙස රු.47,191,000 ක් ක්‍රමක්ෂය කර තිබුණි.

**2.2.3** නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා ණය ශේෂය උපලේඛනය සමග සැසඳීමේදී රු.761,011 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඉදිරිපත් කළ උපලේඛන අනුව වර්ෂයට අදාළ ආයෝජන ආදායම රු.67,874,679 ක් වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ රු.60,743,980 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 7,130,699 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4** පැහැදිලි නොකළ වෙනස්කම්

විශ්වවිද්‍යාලය වෙත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලැබිය යුතු ලෙස රු.651,283 ක ආදායමක් ගිණුම්ගත කර තිබුණ ද, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණේ රු.283,083 ක් පමණි. ඒ අනුව රු.368,200 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5** විගණනය සඳහා සාක්ෂි නොවීම්

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 6,812,102,321 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වෙනත් අරමුදල් ආදායම් | 1,072,485,027 | ආදායම් සහ වියදම් වර්ගීකරණ. |
| (ආ) | වෙනත් අරමුදල් වියදම් | 990,977,313 | |
| (ඇ) | විවිධ ණයහිමියෝ ‘ | 201,171,096 | ශේෂ සනාථ කිරීම් හා රු. 9,556,003 කට අදාළ කාල විශ්ලේෂණ. |
| (ඈ) | විවිධ ණයගැතියෝ | 39,818,516 | ශේෂ සනාථ කිරීම් හා ණයගැති කාල විශ්ලේෂණ. |
| (ඉ) | විවිධ අත්තිකාරම් | 363,930 | ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ. |
| (ඊ) | ස්ථාවර වත්කම් | 4,411,508,085 | වත්කම් පන්ති 06 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සමීක්ෂණ වාර්තා. |
| (උ) | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල මගින් සෘජුවම දරා ඇති පර්යේෂණ ව්‍යාපෘති වියදම් | 79,793,903 | සිදුකළ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු. |
| (ඌ) | පර්යේෂණ අරමුදල් 15 ක වියදම් | 15,984,451 | පර්යේෂණ යෝජනාවලින් හා ප්‍රගති වාර්තා. |
| | | 6,812,102,321 | |

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් විශ්වවිද්‍යාලය සමග එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් ආචාර්යවරුන් 141 දෙනෙකුගෙන්, 2017 මාර්තු 31 දිනට රු.116,686,399 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පීඨ 06 කට අයත් සිසුන්ගෙන් වර්ෂ 01 සිට වර්ෂ 35 කට අධික කාලයක සිට අයවිය යුතුව පැවති රු.2,981,936 ක් වූ ශාලා ගාස්තු හා රු.2,421,663 ක් වූ දඩ ගාස්තු ලෙස එකතුව රු. 5,403,599 ක් මෙතෙක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ තුළ 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලයට අදාළ රු.3,561893 ක ශේෂයක්ද අන්තර්ගතව තිබුණි.

(ඇ) වසර 10 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.113,778 ක් වූ වැටුප් අත්තිකාරම් හා රු.146,489 ක් වූ උත්සව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඉන් රු.227,489 ක් හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) සැපයුම්කරුවන් 10 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.27,093,596 ක් වසරකට අධික කාලයක් ගතවී ඇතත්, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විවිධ පුද්ගලයන් සහ ආයතන 15 ක් වෙත රු.225,245 ක අත්තිකාරම්, ලබා දී වසර 01 සිට වසර 25 දක්වා කාලයක් ගත වී ඇතත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ ප්‍රදේශයේ පිහිටි පර්චස් 40.97 ක ඉඩම, 1987 දෙසැම්බර් 31 දින සිට අවුරුදු 30 ක කාලයක් සඳහා පිඹුරු අංක 1972 මගින් විශ්වවිද්‍යාල කළමණාකාරීත්වය විසින් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණි. බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වාර්ෂික බදු මුදල රු.60,000 ක්වූ අතර, එම වටිනාකම වර්ෂ 05 කට වරක් සංශෝධනය විය යුතු වුවත්, එපරිදි කටයුතු නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයට අයවිය යුතු හිඟ බදු මුදල රු.6,580,000 ක් විය. තවද විශ්වවිද්‍යාල කළමනාකාරීත්වයේ අනුමැතියකින් තොරව රු. මිලියන 11.6 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණු බව අනාවරණය විය.

(උ) පේරාදෙණිය නගරයේ සතිපොළ පැවැත්වීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් රත්මලේ ඉඩමේ පර්චස් 25 ක් බදු පදනම මත 1975 වර්ෂයේ සිට මහනුවර කඩවත් සතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවට වෙත ලබදී තිබුණි. අදාළ බදු ගිවිසුම ප්‍රකාරව 1997, 2001, 2006, 2011 සහ 2016 වර්ෂයන්වලදී සංශෝධිත නව බදු තක්සේරු වටිනාකම අනුව කටයුතු නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයවිය යුතු හිඟ බදු මුදල රු.9,174,000 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත හා කම්කරු කොමසාරිස්ගේ අංක පා/ආයතන/11 හා 2001 අගෝස්තු 24 දිනැති ලිපිය | • නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.108,788 ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු වූ රු.21,757 ක් වූ දායක මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.<br><br>• විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී පීය 07 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, ගෙවන ලද අධ්‍යයන දීමනා අදාළ කර ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ දී විශ්වවිද්‍යාල අරමුදලට සිදු වී ඇති පාඩුව රු. 85,701,160 ක් විය. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ උපයන විට ගෙවීම් අඩු කිරීමේ බදු චක්‍ර අංක 07 | ප්‍රධාන සේවා යෝජකයා නොවන අනෙකුත් සේවා යෝජකයින් විසින් ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් රු. 50,000 ක් ඉක්මවන අවස්ථාවලදී සියයට 10 ක උපයන විට බදු ගෙවීම් අඩු කළ යුතු වුවද, වෛද්‍ය පීඨයේ විභාග ගාස්තු වියදම රු. 1,184,457 කින් රු.118,446 ක බදු අඩුකර නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) | II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) වගන්ති | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයා ගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක ගාස්තුවක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, දන්ත වෛද්‍ය පීඨයට අයත් දන්ත සහායක පුහුණු පාසල හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ගෙවන ලද රු.1,361,000 ක බාහිර දේශන ගාස්තුවලින් රු.136,100 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | II කොටසේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 ඡේද | පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 702 දෙනෙකු, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ 37 දෙනෙකු සහ උපශාලාධිපතිවරු 20 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.2,146,192,760 ක් ගෙවා තිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
-----------------------------------------

| | | |
|---|---|---|
| (i) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 371(2)(අ) | • එදිනෙදා පැන නගින සුළු වියදම් වෙනුවෙන් ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය මත උපරිම රු. 25,000 ක සුළු මුදල් අග්‍රිමයක් ලබාදිය හැකි වුවත්, ශාස්ත්‍ර පීඨය හා වෛද්‍ය පීඨය විසින් සීමාව ඉක්මවා අවස්ථා 03 කදී රු.625,000 ක අග්‍රිමයක් ලබා දී තිබුණි.<br><br>• එදිනෙදා පැන නගින සුළු වියදම් දැරීම සඳහා පමණක් සුළු මුදල් අග්‍රිම උපයෝගී කරගත යුතු වුවද වෛද්‍ය පීඨය සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 15 දින වන විට සුළු මුදල් මගින් දරා ඇති වියදම රු.6,216,742 ක් විය. |
| (ii) | මුදල් රෙගුලාසි 396 | විශ්වවිද්‍යාලය විසින් අවලංගු කර තිබූ රු.1,136,587 ක් වටිනා චෙක්පත් නියමිත ගිණුම්වලට බැර නොකර අවලංගු කළ චෙක්පත් ගිණුමට බැර කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 757(2) හා (4) | • 2016 වර්ෂය සඳහා පීඨ 05 කට අයත් දෙපාර්තමේන්තු 07 ක් හා අනෙකුත් අංශ 02 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 ජූලි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br><br>• විශ්වවිද්‍යාලයට අයත් දොඩම්ගොල්ල ගොවිපලෙහි 2015 දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අයිතම 27 ක තොග ඒකක 66 ක භාණ්ඩ ඌනතාවයක් නිරීක්ෂණය වී තිබුණු නමුත් විගණන දිනය වූ 2016 ඔක්තෝබර් 31 දක්වා එකී ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 770 | සමාලෝචිත වර්ෂයේ අවසන් තොගය තුළ අදාළ රු.920,744 ක් වටිනා කල් ඉකුත් වූ හා ප්‍රයෝජනයට නොගන්නා අයිතම 96 ක් හා සෙමින් චලනය වන රු.1,365,267 ක් වූ අයිතම 51 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 880 | වත්කම් භාරව සිටින හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන්ගෙන් ඇප ලබාගත යුතු වුවත්, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිලධාරීන් 08 දෙනෙකු හා ශාස්ත්‍ර පීඨයේ නිලධාරීන් 04 දෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | **2010** දෙසැම්බර් **31** දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක **26/2010** දරන චක්‍රලේඛයේ **03** ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම් සිදු කිරීමෙන් වළකින ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් දී තිබුණි. එහෙත් ඊට අනුකූල නොවන පරිදි තාවකාලික පදනම මත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය පීඨය සඳහා නිලධාරීන් **06** දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.**722,768** ක මුදලක් ගෙවා තිබුණි. |
| (උ) | **1994** ජූනි **14** දිනැති අංක **95(02)** දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා **2003** ජනවාරි **29** දිනැති අංක **PE 1/174/1-2003** දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | දන්ත සහායක පුහුණු පාසලේ අධ්‍යක්ෂවරයා වෙත රු.**189,165** ක අධ්‍යක්ෂ දීමනා ද, දන්ත වෛද්‍ය පීඨයේ අනෙකුත් නිලධාරීන් සඳහා රු.**155,776** ක මධ්‍යස්ථාන පරිපාලන ගාස්තුද ලෙස එකතුව රු.**344,941** ක් **2015** හා **2016** වර්ෂවලදී භාණ්ඩාගාර අනුමැතිය රහිතව ගෙවා තිබුණි. |
| (ඌ) | **2015** ජූලි **10** දිනැති අංක **02/2015** දරන මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානය වන විට ධාවනයට නොසුදුසු බව දක්වා තිබූ **(Condemned)** වාහන **15** ක් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **03** ට අනුකූලව **2015** වර්ෂයට අදාළව සිදු වී ඇති වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීම වෙනුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර තිබූ අයිතම **04** කට අදාළ රු.**239,948,181** ක මුදල නිවැරදි කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මුදල් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණේ ද **2017** අගෝස්තු **10** දිනදීය.

(ආ) **2003** ජූනි **02** දිනැති පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **8.2.2** ඡේදය සහ **1971** අංක **38** දරන මුදල් පනතේ **11** වන වගන්තිය ප්‍රකාරව අතිරික්ත මුදල්, ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායී ආයෝජනයක යෙදවීමේදී මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර තැන්පතුවල ආයෝජනය කරන ලද රු.**307,515,000** ක් සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මූලධන ව්‍යාපෘති **14**ක් වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් **31** දිනට ඉතිරිව පැවති රු.**716,535,063** ක් සහ සමාලෝචිත වර්ෂයේ ලද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානවලින් රු. **981,434,553** ක මුදලක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෙනත් ඉදිකිරීම් කොන්ත්‍රාත්, උපකරණ, පුස්තකාල පොත් හා වාර සඟරා මිලදී ගැනීමට සහ පුනරුත්තාපන කටයුතු සඳහා අභ්‍යන්තරව මාරු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද මෙම මාරු කිරීම් සඳහා **2017** වර්ෂයේදී පාලක සභා අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරීවරයෙකුගේ වවුචර් සහතික කිරීමේ සීමාව රු.1,000,000 ක් වුවත්, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 02 ක දී රු. 2,751,323 ක වියදම් සහතික කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.76,929,780 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.59,032,023 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.135,961,803 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විදේශ ශිෂ්‍ය ආදායම, උපාධි අපේක්ෂක ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු ආදියෙන් ලද ආදායම රු. 78,460,551 කින් අඩුවීම සහ සැපයුම් සේවා, ශිෂ්‍යයින් සඳහා වූ මූල්‍ය සහය හා වෙනත් වියදම් රු. 287,236,910 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාම ඌනතාවයක් ද, 2015 වර්ෂයේ අතිරික්තයක් ද ඇති වී තිබූ අතර, 2016 වර්ෂයේ දී නැවත ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.2,007,666,786 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේ දී රු.4,420,447,807 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්ය සාධනය

--------------------

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- ගුණාත්මක බවින් යුත් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන්වලින් හෙබි පරිපූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම.
- පර්යේෂණයේ හා සංවර්ධනයේ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.
- යහපාලනයට මඟපාදන උසස් පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාවයකින් යුත් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත්වීම.
- දැනුම හා කුසලතාවන් පදනම් කරගත් සේවාවන් සමාජයට ලබාදීම සඳහා විවෘත හා දුරස්ථ මාර්ග මගින් පුහුණුව ලබාදෙන තෘතීය අධ්‍යාපනය ලැබීමේ ඉඩ ප්‍රස්ථාවන්ට පුළුල් ප්‍රවේශයක් හා වැඩි ඉල්ලුමක් සපයන විශ්වවිද්‍යාලයක් බවට පත්වීම.
- කායික හා මානසික සන්තුෂ්ටියෙන් යුතුව අධ්‍යයන කාර්යයේ නියැලීම සඳහා සන්නයන ගුණයෙන් හා සෞන්දර්යාත්මක පරිසරයකින් යුතු විශිෂ්ඨ ගණයේ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්වීම.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 හා 2014 අයවැය යෝජනා පරිදි පර්යේෂණ දීමනා ගෙවීම මැයෙන් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4(i) වගන්තිය පරිදි පර්යේෂණ දීමනා ලබා ගත් නිලධාරීන් විසින් පර්යේෂණයේ ස්වභාවය, ක්‍රියාකාරී සැලැස්ම, පර්යේෂණ සඳහා ගතවන කාල රාමුව සහ පර්යේෂණ සඳහා යොදාගන්නා ක්‍රමෝපායන් ආදී විස්තර ඇතුළත් පර්යේෂණ යෝජනාවලින් (Research Project) පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් පර්යේෂණ යෝජනාවලින් ඉදිරිපත් කළයුතු කිසිදු නිලධාරියෙක් එකී විස්තර ඇතුළත් පර්යේෂණ යෝජනාවලින් සනාථන පර්යේෂණ කමිටුව වෙත (Senate Research Committee) ඉදිරිපත් කර නොතිබූ අතර, විශ්වවිද්‍යාලය විසින් 2014 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2017 ඔක්තෝබර් 16 දින දක්වා පර්යේෂණ දීමනා ලෙස රු.555,184,343 ක් ගෙවා තිබුණි. 2014 වර්ෂයේ සිට 2017 අගෝස්තු දක්වා කාලය තුළ පර්යේෂණ දීමනා ලබා ඇති නිලධාරීන් පර්යේෂණ පිළිබඳ ප්‍රගති වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පීඨ 09 ක් මගින් ඉදිරිපත් කළ පර්යේෂණ ව්‍යාපෘති 321 ක ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී රු. 196,650,289 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, නිම කර තිබුණේ ව්‍යාපෘති 79 ක් පමණි. ව්‍යාපෘති 11 ක් අවලංගු කර තිබූ අතර සම්පූර්ණ නොකල ව්‍යාපෘති 133 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය දක්වා වටිනාකම රු. 130,143,183 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 179 ක ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා සනාථන පරීක්ෂණ කමිටුව වෙත ප්‍රගති වාර්තා ලබා දී නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව හා පරිත්‍යාග ලබාදීම වෙනුවෙන් ඇති කර තිබුණු අරමුදල් 252 ක රු.169,765,714 ක ශේෂය, වාර්ෂිකව ලබාදුන් ශිෂ්‍යත්ව හා පරිත්‍යාග සමග සැසඳීමේදී වසර 06 ක කාලය තුළ ශිෂ්‍යත්ව ලබාදීම සියයට 9 කට වඩා අඩු ප්‍රතිශතයක පැවති අතර, 2016 වර්ෂයේ සියයට 3.1 ක ප්‍රතිශතයක් වී තිබුණි.

(ඈ) ශිෂ්‍ය හැකියා වර්ධනය (Development of Student Skills) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 - 2016 කාලපරිච්ඡේදය තුළදී රු.36,000,000 ක් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබුණද, එකී ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. 2016 වර්ෂයේ ගිණුම අනුව එකී ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ මුදලින් රු. 11,000,000 ක් ලී බඩු සහ උපකරණ මිලදී ගැනීම සඳහා යොදවාගෙන තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ස්ථිර තැන්පතුවල වටිනාකම රු. 731,237,632 ක සිට රු. 1,295,096,630 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. අරමුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීම සඳහා අවධානය යොමු නොකිරීම, මෙලෙස ස්ථාවර තැන්පතුවල වටිනාකම අඛණ්ඩව වර්ධනය වීමට හේතු වී තිබුණි. මේ තුළ ප්‍රධාන වශයෙන් පර්යේෂණ සඳහා ලද අරමුදල් හා වෙනත් අරමුදල් වලට අයත් ආයෝජනයන් පැවති අතර, එම අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් කළමනාකරණය දැඩි අවධානයක් යොමු විය යුතු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඊ) පර්යේෂණ නිමකළ යුතු කාලය අවසන්ව ඇති එකතුව රු. 2,149,350 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 03 ක පර්යේෂණ කටයුතු විගණන දිනය වූ 2016 ඔක්තෝබර් 12 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) උසස් අධ්‍යාපන කාර්යයන් සඳහා ප්‍රතිපාදිත සම්පත්, කාලය හා ශ්‍රමය යොදාගෙන ආයතනයේ අරමුණුවලට බාහිරව වූ රියදුරු පුහුණු වැඩමුළු දෙකක් ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර, එමගින් රු. 124,660 ක ආදායමක් උපයා තිබුණි.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයින්ට අමතරව නිලධාරීන් තිදෙනෙකු තාවකාලික පදනම මත මාස 06 ක් සඳහා අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශයේ සේවයේ යොදවා තිබුණද, පසුව සේවා දීර්ඝ කිරීම මගින් අඛණ්ඩව සේවයේ යොදවා ගෙන තිබූ අතර, ඔවුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා අරමුදල මගින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 676,800 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගත හැකි සියළුම මුදල් අයකරගත් පසුව ගිවිසුම් කඩකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් ආචාර්යවරුන්ගෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල රු.15,934,927 ක් වී තිබුණි. 2017 සැප්තැම්බර් 30 වන විට ගිවිසුම් කඩ කර වර්ෂ 05 සිට වසර 20 දක්වා කාලයක් ගත වී ඇතත්, එකී ගිවිසුම් සඳහා ඇපකරුවන් ලෙසට අත්සන් කළ නිලධාරින්ගෙන් හෝ ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ට එරෙහිව නඩු පැවරීම මගින් හෝ එම මුදල් අය කර ගැනීමට විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීමේදී එළඹ ඇති ගිවිසුම කඩ කළහොත් විශ්වවිද්‍යාලය වෙත අය විය යුතු මුදල්, එකී ආචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදලේ ඇති මුදලින් හිලවු කර ගැනීම සඳහා කැමැත්ත ලබා දී ඇතත්, 2017 සැප්තැම්බර් 30 වන විට ගිවිසුම් කඩකර වර්ෂ 05 සිට 20 දක්වා කාලයක් ගත වී ඇති ආචාර්යවරුන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු.32,816,182 ක මුදලක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයීය කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී තක්සේරු කිරීම් සඳහා ඉදිරිපත් කර තිබුණු පිරිවැය රු.2,845,000 ක් වූ වාහන 07 ක් සමාලෝචිත වර්ෂය වන විට අස්ථානගත වී තිබුණ ද මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයිතිව තිබූ බෝවලවත්ත ප්‍රදේශයේ අක්කර 16 ක් හා පර්චස් 03 ක වපසරියක භූමි ප්‍රමාණයක් 1985 ඔක්තෝබර් 16 වන දින අංක 1356 දරන බදු ඔප්පුව මගින් සහ 1986 සැප්තැම්බර් 22 වන දින අංක 1520 දරන බදු ඔප්පුව මගින් අවුරුදු 99 ක් සඳහා බදු පදනම මත මහනුවර ජාත්‍යන්තර බෞද්ධ සංවිධානය නම් වූ සංවිධානයක් වෙත පවරා දී තිබූ අතර එම ඉඩමෙහි විශ්වවිද්‍යාලයේ අවසරයකින් තොරව ගොඩනැගිලි ඉදිකර තිබුණි.

(ඊ) ජාතික විද්‍යා පදනම, කාර්ප් (CARP), ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS), IAEA, විවිධ රාජ්‍ය අමාත්‍යාංශ සහ පෞද්ගලික මට්ටමින් විශ්වවිද්‍යාලයට අරමුදල් සැපයීම මගින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ වැඩසටහන් 78 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.95,659,812 ක් වැය කර තිබුණු අතර එකී පර්යේෂණ අරමුදල්හි 2016 දෙසැම්බර් 31 දිනට රු.100,444,228 ක ශේෂයක් පැවතුණි. මෙම පර්යේෂණ ව්‍යාපෘතීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ යෝජනාවලීන් සහ එම පර්යේෂණවල ප්‍රගතිය සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් අධීක්ෂණයක් හෝ නියාමනයක් සිදුකර නොතිබුණි.

(උ) තෝරාගත් විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.174,378,670 ක් වැයකර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වියදම් කළ මුදලින් රු. මිලියන 100 කට ආසන්න මුදලක් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා සේවකයන් බඳවාගැනීම හා නඩත්තු කිරීම සඳහා වැයකර තිබුණ ද පර්යේෂණ මධ්‍යස්ථානයට සේවකයන් බඳවාගැනීම හා ඔවුන්ගේ වැටුප් තීරණය කිරීම සම්බන්ධයෙන් වැටුප් හා සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා වර්ෂ 04 ක් තුළ ලැබී ඇති රු. මිලියන 263 කින් රු.69,098,520 ක් 2013 හා 2016 වර්ෂවලදී විශ්වවිද්‍යාලයේ පරිහරණය සඳහා ලීබඩු සහ උපකරණ මිලදී ගැනීම සඳහා මාරුකර තිබුණි.

(ඌ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 05 තුළදී ආයතනික හා මානව සම්පත් සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘති 04 ක් සඳහා රු. 380,200,000 ක ප්‍රතිපාදන ලැබී ඇති අතර, රු.220,487,945 ක් අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා දරා තිබුණද එකී ව්‍යාපෘතීන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(එ) විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන අක්කර 73 ක් හා පර්චස් 53.4 ක් වන ඉඩම්, විධිමත් පරිදි විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------------

ශාස්ත්‍ර පීඨයට අනුයුක්ත කර ඇති ස්ථිර සේවයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී ම ශාස්ත්‍ර පීඨය යටතේ පවත්වාගෙන යනු ලබන වෙනත් අරමුදල්වලට අදාළ රාජකාරී සිදු කිරීම වෙනුවෙන්, 2015 වර්ෂයේදී නිලධාරීන් 63 දෙනෙකු වෙනුවෙන් එකතුව රු. 1,719,229 ක් හා 2016 වර්ෂයේදී නිලධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් එකතුව රු. 1,115,893 ක් දීමනා ලෙස ගෙවීම් කර ඇති අතර, 2015 සහ 2016 වර්ෂවල දී තාවකාලික පදනමින් ශාස්ත්‍ර පීඨයේ සේවය කළ නිලධාරීන්ට රු. 6,662,829 ක දීමනාවක් ද ගෙවා තිබුණි.

**4.4** දෘශ්‍ය අක්‍රමිකතා

-----------------------

විශ්වවිද්‍යාල උපකුලපතිගේ 2012 සැප්තැම්බර් 29 දිනැති චක්‍රලේඛයට පටහැනිව එක්සත් රාජධානියේ හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය (University of Huddersfield) විසින් මෙහෙයවනු ලබන Capacity Building and Asia for Resilience Education (CABAREK) ව්‍යාපෘතිය සඳහා පාලක සභාවේ හෝ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය වෙනුවෙන් ඉංජිනේරු පීඨයේ මහාචාර්යවරයෙකු විසින් 2017 පෙබරවාරි 02 දින ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියට අදාළව රු.5,582,878ක මුදලක් එම මහාචාර්යවරයා විසින් පෞද්ගලික බැංකු ගිණුමකට බැර කර ගෙන තිබු අතර, 2017 ජූලි 14 දින යථෝක්ත මුදල ඉංජිනේරු පීඨයේ පර්යේෂණ ගිණුම වෙත බැර කර තිබුණි. 2017 අගෝස්තු 15 දින විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් නැවත ගිවිසුම්ගත වී තිබුණි.

**4.5** අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී රු. 25,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ ව්‍යාපෘති 07 ක වැඩ අවසන් කර තිබුණද, ඉතිරිව පැවති ප්‍රතිපාදන රු. 8,725,499 ක් නිෂ්කාර්යව පැවති නමුත් එම මුදල් වෙනත් ව්‍යාපෘතිවලට මාරුකර උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල මගින් පීඨ වෙත ලබා දෙන ප්‍රතිපාදන වර්ෂය තුළ දී සම්පූර්ණයෙන් උපයෝජනය කරගෙන නොතිබුණු අතර, ඒ පිළිබඳව නිසි ඇගයීමකින් තොරව වාර්ෂිකව පීඨ මගින් ඉල්ලා සිටින ඇස්තමේන්තු ගත මුළු පර්යේෂණ පිරිවැය ලබා දීම නිසා පීඨ පර්යේෂණ අරමුදල්හි ශේෂයන් වාර්ෂිකව ඉහළ යමින් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2014 වර්ෂයේ රු.34,428,515 ක් වූ පීඨ පර්යේෂණ අරමුදල් ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 92,806,102 ක් දක්වා සියයට 270 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) ඵලදායී ලෙස උපයෝජනය නොකිරීම හේතුවෙන් කාණ්ඩ 04 ක් යටතේ පිහිටුවා තිබූ අරමුදල් 596 ක සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.1,232,459,775 ක් වූ අතර, වර්ෂය අවසානයට එම ශේෂය රු.1,305,209,788 ක් දක්වා වර්ධනය වී තිබුණි. එයින් අරමුදල් ගිණුම් 62 ක රු.32,721,565 ක මුදලක් ඒවායේ අරමුණු ඉටුකර ගැනීමට උපයෝජනය නොකර වසර 01 සිට වසර 05 දක්වා කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඈ) බාහිර ආයතන මගින් අරමුදල් සපයන ලද රු.628,537,264 ක් වූ පර්යේෂණ ව්‍යාපෘතීන් 14 ක් සම්බන්ධයෙන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

(ඉ) ඉදිකිරීම් ව්‍යාපෘති 16 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු.818,000,000 ක් වූ ප්‍රදාන මගින් අදාළ කාර්යය සඳහා උපයෝජනය කර තිබුණේ රු.531,233,261 ක් හෙවත් ප්‍රතිපාදිත මුදලින් සියයට 65 ක් පමණි.

**4.6** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නීත්‍යානුකූලව පිහිටුවා නොතිබිය දී ඒ සඳහා රු.21,000,000 ක් වටිනා රසායනාගාර උපකරණ මිල දී ගෙන වෛද්‍ය පීඨයේ නිර්වින්දන හා විකිරණවේදී දෙපාර්තමේන්තුවලට ලබා දී තිබුණි. උපකරණවල වගකීම් කාලය අවසන් වී තිබුණ ද පාවිච්චියට නොගෙන වසරකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය වූ අතර, මෙම උපකරණ භාවිතය සඳහා අදාළ සැපයුම්කළ ආයතනය මගින් ලබා දෙන පුහුණුව ලබා ගැනීමට ද විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් මාසයේදී ශාස්ත්‍ර පීඨ ශිෂ්‍යයින්ගේ නවෝත්පාදන සංවර්ධන (Invatory Development of Art Student) ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ රු.3,427,621 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වසර 02 කට ආසන්න කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ දී විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අදාළත්වය හා ගුණත්වය වර්ධනය කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය මගින් රු. 1,191,381 ක වියදමින් ශාස්ත්‍ර පීඨයේ කාමරයක පරිගණක වෙන්කිරීමේ කුටි ඉදිකර එම කාමරය ශාස්ත්‍ර පීඨයේ වෙනත් දෙපාර්තමේන්තුවකට පවරා දී ඇතත්, මෙම කාමරය හා අදාළ වෙන්කිරීම් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 05 කට අධික කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ඈ) නේවාසික පහසුකම් අධ්‍යක්ෂ විසින් සියලු නේවාසිකාගාරයන් සඳහා 9W හි LED විදුලි බුබුළුවල අවශ්‍යතාවය 4590 ක් ලෙස විශ්වවිද්‍යාල කළමනාකාරීත්වයට දන්වා ඇතත්, එය නොසලකා 9W විදුලි බුබුළු වෙනුවට රු. 9,350,000 ක් වටිනා 12 W LED ග්ලෝබ් විදුලි බුබුළු 7000 ක් සහ අවශ්‍යතාවය හඳුනා නොගත් 4' ක් ටියුබ් ලයිට් 2000 ක් මිල දී ගෙන තිබුණි. විගණන දිනය වන විට LED විදුලි බුබුළු මිල දී ගෙන වසරක් සහ මාස 03 ක් ගත වී තිබුණද, එකතු වටිනාකම රු.3,181,800 ක් වූ එනම් මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 46 ක් වූ LED විදුලි බුබුළු 3220 ක් පාවිච්චියට නොගෙන ගබඩා කර තිබුණි. මිල පහළ යන, තාක්ෂණය වෙනස් වන සහ සීමිත වගකීම් කාලයක් ලබාදෙන මෙවැනි උපකරණ මිලදී ගෙන අනවශ්‍ය ලෙස ගබඩා කර තබා ගැනීම අනාර්ථික වියදමක් බව ද නිරීක්ෂණය විය.

(ඉ) ඉදිකිරීම් කටයුතු අවසන් කර විශ්වවිද්‍යාලය වෙත පවරා දී තිබූ රු.676,283,400 ක් වටිනා ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් අවශ්‍ය යටිතල පහසුකම් සපයා නොතිබීම නිසා 2017 ඔක්තෝබර් 31 වන විටත් ශිෂ්‍යයින්ගේ ප්‍රයෝජනය සඳහා යොදා නොගෙන මාස 10 සිට වසර 03 ක පමණ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

**4.7** හඳුනාගන්නා ලද පාඩු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය මගින් පිළියෙල කර තිබූ ගිවිසුම් කඩකළ පැරණි ආචාර්යවරුන්ගේ ලේඛනය අනුව විශ්‍රාම ගිය ආචාර්යවරුන් 78 දෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.34,028,333 ක් වූ ගිවිසුම් ගත මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සේවය කළ මහාචාර්යවරයෙකු 2014 අගෝස්තු 04 දින සිට වැටුප් රහිත නිවාඩු මත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා වසර 03 ක කාලයකට මුදා හැර තිබුණි. එම කාලය අතරතුර මෙම මහාචාර්යවරයා වෙත මාස 11 ක් හා දින 03 ක කාලයක් වෙනුවෙන් විශ්වවිද්‍යාලය මගින් පාලක සභා අනුමැතියකින් තොරව වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා දී සියළු දීමනා සහිතව විශ්වවිද්‍යාලය මගින් ද වැටුප් ගෙවීමට කටයුතු කර තිබූ අතර විගණන දිනය වූ 2017 මාර්තු 03 දින වන විට මාස 06 ක කාලයක් වෙනුවෙන් රු.1,523,935 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි.

**4.8** **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වැඩ අවසන් නොවූ ප්‍රමාද කාලය දින 760 සිට දින 1063 දක්වා වන ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන්කල මුදල් උපයෝජනය නොකර වෙනත් ව්‍යාපෘති සඳහා භාවිතා කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 06 ක් සඳහා වෙන් කළ රු. 365,652,114 ක් වූ ප්‍රතිපාදනවලින් රු. 356,400,000 ක් වෙනත් ව්‍යාපෘති සඳහා යොදා ගෙන තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් ලබා ගෙන තිබූ ප්‍රාග්ධන ප්‍රදාන ඒ ඒ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය අනුව හඳුනාගෙන වෙන් කිරීම වෙනුවට සැලසුම් රහිතව විවිධ ව්‍යාපෘතිවලට මාරු කිරීම හා එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වසර ගණන් ප්‍රමාද තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වැඩ දෙපාර්තමේන්තුවෙහි ලේඛනය අනුව භෞතික ප්‍රගතිය සියයට 100 ලෙස දක්වා තිබූ ව්‍යාපෘති 32 ක් 2017 සැප්තැම්බර් 30 දින වනවිට ද, කෙරීගෙන යන ව්‍යාපෘති ලෙස වර්ෂය අවසාන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. වැඩ අවසන් කළ යුතු දිනය ඉක්මවා දින 288 සිට දින 1661 දක්වා කාලයක් ගත වී ඇතත්, ඊට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට හා 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.93,242,303 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කළ යුතු ව්‍යාපෘති 36 ක් 2017 සැප්තැම්බර් 30 වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

(ඊ) කෘෂිකර්ම පීඨයේ ප්‍රායෝගික පුහුණුව සඳහා පවත්වාගෙන යන මහඉළුප්පල්ලම කෘෂිකර්ම උප පීඨයේ එක් වසරකදී මාස 06 ක පමණ කාලයක් තුළ ශිෂ්‍යයන් 150 ක් පමණ අධ්‍යයන කටයුතුවල යෙදී තිබුණි. එහෙත් ඒ පිළිබඳ ඇගයීමක් නොකර ශිෂ්‍යයන් 400 ක් සඳහා රු.225,427,400 ක් වටිනා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකර තිබුණු අතර විගණන අවස්ථාව වන විට ශිෂ්‍යයින් 200 කට පමණක් ලීබඩු හා උපකරණ ලබා දී තිබුණි.

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 08 දිනදීය.

**5.2** අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

අයවැයගත හා තත්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා සියයට 69 සිට සියයට 3250 දක්වා පරාසයක් තුළ ආදායම් රැස්කර තිබුණු අතර, අයවැයගත හා තත්‍ය වියදම් සැසඳීමේදී වැය විෂයන් 23 ක් ඇස්තමේන්තුගත වියදම ඉක්මවා සියයට 20 සිට සියයට 100 ක් දක්වා පරාසයක් තුළ වැය කර තිබුණි. තවද, වැය විෂයයන් 24 ක ඇස්තමේන්තුගත වියදම්වලින් සියයට 18 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ ඉතිරිවීම් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6.** පද්ධති හා පාලනයන්

-------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආදායම් වියදම් නිසිපරිදි වර්ගීකරණය කර නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | (i) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | අරමුදල් විධිමත් පරිදි අදාළ අරමුණු ඉටුකර ගැනීමට භාවිතා නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පාලනය | (i) | මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ ඇගයීමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | (i) | නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| | | (ii) | ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොකිරීම. |